# අධ්‍යාපන අමාත්‍යාංශය

# 9 ශ්‍රේණිය - 1 කොටස

# ප්‍රායෝගික හා තාක්ෂණ කුසලතා




**මෙහෙයවීම -**

තාක්ෂණ ශාඛාව

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ

එල්. එස්. කේ. වික්‍රමසිංහ මිය.

**සැලසුම් කිරීම සහ සකස් කිරීම -**

කේ. ඒ. ඩී. ප්‍රියානි ජයමැණිකේ මිය.

ගෘහ ආර්ථික විද්‍යා ගුරු උපදේශක

(කැලණිය අධ්‍යාපන කලාපය)

එස්. ඒ. ඩී. දුශාරා දිල්රුක්ෂි මිය.


බප/කැල සපුගස්කන්ද ම.වි.

තාක්ෂණික ක්ෂේත්‍රය

# 1 කෘෂිකර්මය

## 1.1 කෘෂි ව්‍යවසායකත්වය වෙත යොමු වෙමු









දුවේ පුතේ පෙළපොතේ පාඩම් කියවන්න. පහත දක්වා ඇති ක්‍රියාකාරකම්වල යෙදෙන්න. ඔබේ ක්‍රියාකාරකම් ගුරුතුමාට / ගුරුතුමියට ඉදිරිපත් කරන්න. ලකුණු ලබා ගන්න. සතුටු වෙන්න. ඔබේ හැකියා හඳුනා ගන්න.

# 8 ශ්‍රේණියේදී ඔබලා පුංචි ගෙවත්ත හඳුනා ගත්තා........

1. අපිට ගෙවත්තකින් ලබා ගත හැකි ප්‍රතිලාභ බොහොමයක් ඇත.ඒ මොනවාද ?





2. කෘෂි නිෂ්පාදන හා කෘෂි සේවා සැපයිය හැකි ගෙවත්තක් සංවර්ධනය කිරීමේදී අවධානය යොමු කළ යුතු කරුණු ලියන්න.





3. ආදයම් ලැබිය හැකි කෘෂි බෝග නම් කරන්න.





4. මුකුනුවැන්න ඉත්තකින් ගත හැකි දඬු වර්ග 3 නම් කරන්න.රූප සටහන ඇඳ පෙන්වන්න.

5.සිඟිති උයනක් සැකසීමට ගත හැකි බඳුන් වර්ග ලියන්න.

6. සිඟිති උයනක සිටුවිය හැකි බෝග මොනවාද ?





## 7. ගෙවත්තෙන් ලබා ගන්නා බෝග පාරිභෝගිකයන්ගේ සිත් ඇද ගන්නා ලෙස සකස් කර ඉදිරිපත් කළ හැකි ආකාර ලියන්න.






## 8. මුං ඇට අංකුර අදවා ගන්නා අයුරු පියවර වශයෙන් ලියන්න.නිවසේදී මෙම ක්‍රියාකාරකම කරන්න.







## 9. ආකර්ශනීය ඇසුරුම් වල දමා වැඩි මිලකට අලෙවි කරන කල්තබා ගත හැකි ආහාර නම් කරන්න.






10. ආදායම් ලැබිය හැකි කෘෂි සේවා මොනවාද? පෙළ පොත අධ්‍යනය කර සියල්ල ලියන්න.


11. එම සේවා සඳහා උදාහරණ ලෙස පින්තූර ඉදිරිපත් කරන්න.




12. කොකිඩාමා වගාව යනු කුමක්ද? විස්තර කරන්න. පින්තූර අලවන්න.

13. පෙළ පොත අධ්‍යනය කර කොකිඩාමා වගාවක් ආරම්භ කරන්න. ගුරුතුමාට / ගුරුතුමියට ඉදිරිපත් කරන්න. ලකුණු ලබා ගන්න.



14. පෙළ පොත අධ්‍යනය කර වීදුරු බෝතලයක ක්ෂුද්‍ර රූපි උද්‍යානයක් නිර්මාණය කර ගුරුතුමාට / ගුරුතුමියට ඉදිරිපත් කරන්න. ලකුණු ලබා ගන්න.














15. පෙළ පොත අධ්‍යනය කර සිහිති උයනක් සකස් කරන්න. ගුරුතුමාට / ගුරුතුමියට ඉදිරිපත් කරන්න. ලකුණු ලබා ගන්න.





16. පෙළ පොත අධ්‍යනය කර සජීවි කලා නිර්මාණයක් සකස් කරන්න. ගුරුතුමාට / ගුරුතුමියට ඉදිරිපත් කරන්න. ලකුණු ලබා ගන්න.







17. බීජ සහ බඳුන් ගත බෝගවල අගය වැඩි කර ගත හැකි ක්‍රම මොනවාද?

18. සීමිත ඉඩකඩක් සඳහා සුදුසු වගා ක්‍රම නම් කරන්න.

19 මේ සඳහා උපයෝගී වන, ආදායම් ඉපයිය හැකි, ද්‍රව්‍ය මොනවාද?







20. පෙළ පොත අධ්‍යනය කර චතුර්පියන් බද්ධය කරන්න. ගුරුතුමාට / ගුරුතුමියට ඉදිරිපත් කරන්න. ලකුණු ලබා ගන්න. ඔබට ව්‍යාපෘති කිරීමට ඇත. ඒ සඳහා පෙළ පොත අධ්‍යනය කරන්න.



1. රබර් පටිය යොදා අගල් 2 - 3 පොත්තක් 4 පැත්තෙන් රබර් පටිය දක්වා විවෘත කිරීම

2. අනුජය පොතු අතරට ඇතුල් කිරීම

3. රබර් පටිය ඉහළට ඇද වෙළුම් පටිවලින් වෙළීම

## තාක්ෂණික ක්ෂේත්‍රය

# 2 ආහාර

## 2.1 ආහාර මූලික කරගත් කර්මාන්ත හඳුනා ගනිමු.














1) ආහාර මූලික කරගත් ඔබ දන්නා කර්මාන්ත නම් කරන්න.
උදා:- අයිස් ක්‍රීම් කර්මාන්තය.

2) ආහාර ආශ්‍රිත කර්මාන්තවල පැවැත්ම කෙරෙහි බලපාන සාධක නම් කරන්න.

3) ආහාර සඳහා ප්‍රමිති හා පිරිවිතර යොදා ගැනීමේ වැදගත්කම දැක්වෙන කරුණු ලියන්න.





4) ශ්‍රී ලංකාවේ භාවිත වන ජාත්‍යන්තර ප්‍රමිතිකරණ සංවිධානය ප්‍රමිති ලබාදෙන ආයතනයකි. එහි සංකේතය ඇඳ පෙන්වන්න.

5) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයද ආහාර වල ප්‍රමිතිය තීරණය කරන ආයතනයකි. එහි සංකේතය ඇඳ පෙන්වන්න.

6) සෞඛ්‍යාරක්ෂිතව ආහාර සැකසීමේදී ආහාර සකසන්නා ආරක්ෂිත ඇඳුම් පැළඳුම් ඇඳිය යුතුය. එම ඇඳුම් කට්ටලය ඇඳ පෙන්වන්න.

7) ආහාර සකසන පුද්ගලයකු තුල තිබිය යුතු සෞඛ්‍යාරක්ෂිත හොඳ පුරුදු ලියන්න.





8) ආහාර තෝරා ගැනීමේදී එහි ලේබලය හොඳින් කියවීම වැදගත්ය. ආහාර ලේබලයක් නිර්මාණය කරන්න.



ආහාර නිෂ්පාදනයේ දී හොඳ නිෂ්පාදන පුරුදු (GMP - Good Manufacturing Practices) භාවිතයෙන්, ඉහළ ගුණාත්මක බවකින් සහ සෞඛ්‍යාරක්ෂිත බවකින් යුතු ආහාර පාරිභෝගිකයින්ට ලබා දීමට නිෂ්පාදකයාට හැකියාව ලැබේ.


9. හොඳ ආහාර නිෂ්පාදන පුරුදු කොටස් හතර විස්තර කරන්න.



10. ආහාර නියමිත පරිදී සකස් කිරීමේ ක්‍රියාවලිය උදාහරණ මගින් පැහැදිලි කරන්න.



11. ඔබ කැමති පලතුරක් තෝරා ගෙන අවම ලෙස සකස් කළ හැකි ආකාරයට සකස් කර ඇසුරුම් කරන්න. ගුරුතුමාට / ගුරුතුමියට ඉදිරිපත් කර ලකුණු ලබා ගන්න.




12. එය ඇසුරුම් කල ක්‍රියාවලිය පියවර ක්‍රමයට ලියන්න.

13. එයට ලේබලයක් නිර්මාණය කර විධිමත් කරන්න.

14. දේශීය ආහාර පරිභෝජනය කිරීමේ වාසි මොනවාද?

15. ලංකාවට ආවේණික එළවළු සහ පලතුරු ලයිස්තුවක් ලියන්න.




තාක්ෂණික ක්ෂේත්‍රය

# 3 ආරම්භක තාක්ෂණවේදය

## 3.1 අවශ්‍යතා සපුරාලීමට තාක්ෂණික සේවා යොදා ගනිමු





**අතීතයේ මිනිසා තම අවශ්‍යතා සපුරා ගත්තේ ඉතා දුක් මහන්සියෙනි.**




**වර්තමානයේ මිනිසා තම අවශ්‍යතා හා සේවා ඉතා පහසුවෙන් ලබා ගනියි.**



1. මිනිසා මෙම විසඳුම් සොයන්න ගත්තේ ඇයි?







2. ඔබ පාසල තුළ ඇති විය හැකි ගැටලු තත්ත්ව මොනවාද?

3. ඔබ නිවස තුළ ඇති විය හැකි ගැටලු තත්ත්ව මොනවාද?

4. පාරේ යන විට ඇති විය හැකි ගැටලු තත්ත්ව මොනවාද? ලයිස්තු ගත කරන්න.







5. ගැටලු හඳුනා ගැනීම සඳහා සලකා බැලිය යුතු කරුණු මොනවාද?

6. ඔබ හඳුනා ගත් ගැටලුවක් සඳහා පෙළ පොත ද අධ්‍යනය කර ව්‍යාපෘති යෝජනාවක් සකස් කර ගුරුතුමාට ගුරුතුමියට පෙන්වන්න. ලකුණු ලබා ගන්න.

තාක්ෂණික ක්ෂේත්‍රය

# 4 ව්‍යාපාර

## 4.1 කුඩා ව්‍යාපාරයක් සාර්ථකව පවත්වාගෙන යාම සඳහා බලපාන සාධක හඳුනා ගනිමු


**දුවේ පුතේ,ඔයාලා පුංචි කාලේ මේ වගේ පුංචි කඩයක් දාලා සෙල්ලම් කලා මතකද?**

- ❖ කඩේ මුදලාලි......
- ❖ බඩු ගන්න එන අය......

**හරිම සුන්දරයි ඒ අතීතය...........**





**එහෙනම් අද අපි බලමු ඇත්තම වෙළඳසලක් කියන්නේ කුමක්ද කියලා. එයට තවත් නමක් කියනවා ව්‍යාපාර කියලා.**

**මෙම ආකාරයෙන් ව්‍යාපාර කොටස් 3 කට බෙදෙනවා.**

**මෙම ව්‍යාපාර කොටස් 3 කි.**

- කුඩා පරිමාණ ව්‍යාපාර
- මහා පරිමාණ ව්‍යාපාර
- මධ්‍යම පරිමාණ ව්‍යාපාර



කුඩා පරිමාණ ව්‍යාපාර



මධ්‍යම පරිමාණ ව්‍යාපාර



මහා පරිමාණ ව්‍යාපාර

1.කුඩා පරිමාණ ව්‍යාපාරයක ලක්ෂණ ලියන්න.

2.ව්‍යවසායකයින් කුඩා ව්‍යාපාර වෙත යොමු වීමට හේතු ලියන්න.

**3) ඔබ ප්‍රදේශයේ පවතින ව්‍යාපාරයක් තෝරා ගන්න.එම ව්‍යාපාරය සම්බන්ධව පහත කරුණු පිළිබඳ තොරතුරු රැස් කරන්න.**

| | |
|---|---|
| ❖ ව්‍යාපාරයේ නම | |
| ❖ ඉටු කරනු ලබන කාර්යය | |
| ❖ ආයෝජනය කර ඇති ප්‍රාග්ධනය පිළිබඳ තොරතුරු | |
| ❖ සේවක සංඛ්‍යාව | |
| ❖ නිෂ්පාදන කටයුතු සිදුකරන ආකාරය | |
| ❖ ව්‍යාපාරික කටයුතු ව්‍යාප්ත වී පවතින සීමාව | |

**4) කුඩා පරිමාණ ව්‍යාපාර වර්ධනය වීම නිසා රටක ආර්ථික සංවර්ධනයට ලැබෙන ප්‍රතිලාභ මොනවාද?**

**5) ව්‍යාපාරයක් වඩාත් සාර්ථකව පවත්වාගෙන යාමට බලපාන සාධක මොනවාද?**

දුවේ, පුතේ ඔබ කැමති නිර්මාණ එකතුවක් කරන්න. (අවමය පහයි) එය විධිමත්ව හැකි  ආකාරයකට ගුරුතුමියට / ගුරුතුමාට ඉදිරිපත් කර ලකුණු ලබා ගන්න.

ආදරණීය දුවේ පුතේ ඔබේ හැකියා හඳුනා ගන්න, නිර්මාණශීලී වන්න. නව නිපැයුම් ගැන සිතන්න. ලෝකය දිනන්න අලුතින් සිතන්න. ලොව ජයගත් පුද්ගලයන් ගැන වැඩිහිටියන්ගෙන් අසා දැන ගන්න. අන්තර්ජාල තොරතුරු ගවේෂණය කරන්න. වැඩදායි පුරවැසියකු වන්න උත්සහ ගන්න.



ගුරුභවතුන්ට උපදෙස් -

- දරුවන් අගය කිරීමට පෙළඹෙන්න.
- දරුවන්ගේ ඇඟයීම් වෙනුවෙන්, මෙම පාඩම් ආශ්‍රිතව, නිර්ණායක මත, ඇඟයුම් ක්‍රමවේද නිර්මාණය කර ගන්න.
- නිදහස් නිර්මාණවලට සිසු දරුවන් යොමු කර අවස්ථා පහක් ඇඟයීමට ලක් කරන්න.
- කාර්ය සාධන පත්‍රිකාව සඳහා ලබා දෙන ඇඟයීම් ලකුණු මේ වෙනුවෙන් පිරිනමන්න.